


# පාහියංගල බලන්න ආවා

පාරේ සිට ම ඇරඹෙන වමට ඇති ගල් පඩිපෙළින් ඉදිරියට නගින විට හමුවන්නේ සංඝාවාසයයි. සංඝාවාසය ඉදිරිපිට වම් පසට වන්නට තිබුණේ ලයිට් එන්ජින් සවිකළ ආවරණය කළ මඩුවයි.

මෙම සංඝාවාසයේ බුලත්සිංහල පාසලේ දී අපට බෞද්ධ සංස්කෘතිය උගන්වන ශාස්ත්‍රාචාර්ය පණ්ඩිත වෑවල ධම්මරංසි ස්වාමීන්වහන්සේ ඇතුළු ස්වාමීන්වහන්සේලා වැඩ විසූහ. වෑවල ධම්මරංසි ස්වාමීන්වහන්සේ පාහියංගල විහාරාධිපති පදවිය දැරූ අතර කඳනේ පඤ්ඤාසේකර ස්වාමීන්වහන්සේ හැඳින්වූයේ 'පොඩිහාමුදුරුවො'කියා ය.

**පුංචි හාමුදුරුවන් ඉස්සර වුණු අතර අපි උන්වහන්සේ පිටුපසින් පඩිපෙළ නැග්ගෙමු. රැහැයියන්ගේ නොනවතින නලා ශබ්දය අතරින් මතුවන කුරුල්ලන්, ලෙහෙනුන්, දඬු ලෙහෙනුන් ආදී සතුන්ගේ ශබ්ද වනාන්තරයක ඇති චමත්කාරය පෙන්නුම් කෙරෙයි.**

පාසලේ දී ඇති අපේ දැනහැඳුනුම්කම් අනුව නායක හාමුදුරුවන් සොයාගෙන සංඝාවාසය ඇතුළට ම ගියෙමු. උන්වහන්සේ සතුව තිබූ විශාල පුස්තකාලයේ මේසය අසල පුටුවක වාඩි වී පොතකට නෙත් හෙළා ගෙන පසු වූ උන් වහන්සේ අප දෙස බැලුවේ කන්නාඩිය ගලවා පසකට කරමින් ය. අප හඳුනාගත් ස්වාමීන්වහන්සේගේ මුහුණෙහි මතු වූයේ සිහින් සිනා ඉරකි. ඉහළට පහළට හිස සෙලවූ උන්වහන්සේ අපට ළඟට කතා කළේ අතින් සන් කරමිනි. අපි සියලු දෙනා දණ ගසා උන් වහන්සේට වැඳ එකත්පස්ව සිටියෙමු.

''කොහේද මේ කාණ්ඩෙ යන්නෙ?''

''පාහියංගල බලන්න ආවා.''

''හොඳයි. දැන් උදේට කාල හෙමද ඇවිත් ඉන්නෙ.?''උන් වහන්සේ අප හැම දෙනාගේ ම මුහුණු දෙස බලමින් විමසුවේ දත් නොපෙනෙන සිනාවෙනි.

''එහෙයි - එහෙයි - එහෙයි'' අප සෑම දෙනාගේ ම මුවගින් පිට වන්නට ඇත.

''හා කමක් නෑ තේ ටිකක් බීල ම ගියානං. සෝමදාස..... තේ ටිකක් හදන්න මේ ළමයින්ට බොන්න.'' යනුවෙන් පැවසූ උන්වහන්සේ අප එකිනෙකාගේ ගෙවල් දොරවල් ගැන, පදිංචි ස්ථාන ගැන, ගෙදර සිටින සහෝදර සහෝදරියන් ගණන, තාත්තා මොකද කරන්නේ ආදිය පිළිබඳව සැම දෙනාගෙන් ම වාගේ විමසූහ.

අපි සෝමදාස ගෙනා තේ බීවේ හැලප සහ අලුවා සමග ඇඹුල් කෙසෙල් ගෙඩි ද කෑමෙන් පසුව ය.

''මා ළඟ ඔය ළමයින්ට කියවන්න පොත් ඕනෙ තරම් තියෙනව. ඉවර තියෙන වෙලාවට ඇවිදින් පොතක් දෙකක් ගෙනිහින් කියවල ගෙනත් දුන්නට කමක් නැහැ.'' හාමුදුරුවෝ පැවසූහ.

''හොඳයි උඩට යන්න. මං පොඩි හාමුදුරු නමකුත් එවන්නං.'' පැවසූ ස්වාමීන්වහන්සේ එතැනින් ඉහළට යෑමට අපට අවසර ලබා දුන්නේ ද දෙතොල් සිනාවෙනි.

පුංචි හාමුදුරුවන් ඉස්සර වුණු අතර අපි උන්වහන්සේ පිටුපසින් පඩිපෙළ නැග්ගෙමු. රැහැයියන්ගේ නොනවතින නලා ශබ්දය අතරින් මතුවන කුරුල්ලන්, ලෙහෙනුන්, දඬු ලෙහෙනුන් ආදී සතුන්ගේ ශබ්ද වනාන්තරයක ඇති චමත්කාරය පෙන්නුම් කෙරෙයි. මග දී හමුවුණු රට ගොරකා ගසක කහ පාටින් බැබලුණු ගොරකා කඩා මද කෑවේ දැඩි ගිජුකමිනි. ගල්වලින් නිමවුණු පඩිපෙළ මතින් ටික දුරක් යන විට ගල්ලෙනට තරමක් කිට්ටුවෙන් සිමෙන්ති බදාමයෙන් නිමා කළ පඩිපෙළ හමුවේ. එම පඩිපෙළ මතින් තව ටිකක් ඉදිරියට නැගුණු පසුව විශාල ගල්ලෙනේ ආරම්භය දිස් වේ. මෙම ස්ථානයේ සිට කෙළින් ම ඉහළ බැලූ විට මහා විශාල ගල් පර්වතය විශාල බිත්තියක් ලෙස ඉහළින් පෙනෙන්නේ විස්මයජනක බවක් ද මුසු කරමිනි.

''ඉස්සර ලොකු ගිජු ලිහිණියො දෙන්නෙක් ඉඳල තියෙනව. ඒ ඉඳල තියෙන්නෙ මේ ගල මැද්දෙ අර තියෙන ගුහාවෙ.'' පුංචි ස්වාමීන් වහන්සේ අපට ඇඟිල්ල දිගු කර පෙන්වූයේ මහා ගල් ශිඛරයේ මැද ඇති තරමක ගුහාවකි.

''ඉතින් ඒ කුරුල්ලො රෑට යනවලු කෑම සොයාගෙන. ඒ යන එන සද්දෙට නිදා ඉන්න අයත් ඇහැරෙනවලු. උන්ට තිබුණේ මහ තඩි පියාපත් ලු. උන් ඉගිලිලා මුහුදට ගිහිල්ල ලොකු මාළු අල්ලගෙන එනවලු. පස්සෙ මේ ගුහාවට වෙලා කනවලු.'' අප අසා සිටියේ පුදුමයෙනි.

''ඔය ගල දිගේ බඩ ගාගෙන එක්කෙනෙක් ගිහින් තියෙනව ඒ ගුහාවට. ඒක ඇතුළෙ තිබුණාලු මාළුන්ගෙ ඇටකටු එහෙම.'' පුංචි හාමුදුරුවන් දිගටම පවසන දෙය අපි පුදුමයෙන් ඇහුම්කන් දුන්නෙමු.

''දැන් උන් ඒකෙ නැතිලු.''



පුංචි හාමුදුරුවෝ කිසිම වෙහෙසක් නැතිව ඉහළට නගිති. අප උන් වහන්සේ පිටුපසින් යන්නේ තරමක් හෙමිනි. ටික දුරක් නගින හාමුදුරුවෝ නැවතී හිනාවෙමින් බලා සිටින්නේ අප ළඟට එනතුරු ය.

පර්වතය අයිනෙන් ම ඉහළට නගින පඩිපෙළ මතින් මුදුනට නැගුණු පසු ඇත්තේ මහා විශාල ගල්ලෙන ය. මෙවන් විශාල ලෙනක් ලංකාවේ තවත් නැත. ලංකාවේ තබා අග්නිදිග ආසියාවේ ම නැත. උසින් ද පළලින් ද ඇතුළතට ඇති දිගින් ද බලන විට ලෙනෙහි පරිමාණය අති විශාල ය. කිසිම දිනක දිය පොදක් නොදුටු ඇතුළත පොළොව සියුම් දූවිල්ලෙන් වැසී පා දෙකට දෙනුයේ සියුම් සුවයකි.

''මගෙ අම්මෝ ලොකු'' පුදුමයට පත්ව කෑගැසුවේ තිලකරත්න ය.

''හොඳයි කියන්න බලන්න මේ ලෙන ඇතුළෙ වැස්සකට තෙමෙන් නැතුව කී දෙනෙකුට ඉන්න පුළුවන්ද?'' පුංචි හාමුදුරුවෝ අපට ගෙන ආවේ පැනයකි.

''පන්සීයකට, දාහකට, ඊටත් වැඩිය'' එක එක් කෙනාගේ මුවගින් පිටවෙයි.

''නෑ...... ඕනෙම වැස්සකට තුන්දාහකට වැඩිය ගානකට ඉන්න පුළුවන්.''

''මගෙ අම්මෝ'' ඒත් තිලකරත්න ම ය.

**මතු සම්බන්ධයි**

DOCUMENT TRANSLATIONS WITHIN A DAY
SWORN TRANSLATIONS ● NAATI TRANSLATIONS
ඕනෑම භාෂාවකට අයත් ලේඛණයක්
සීඝ්‍රගාමී පරිවර්තනය සඳහා
අප අමතන්න
03 9792 9977
සඳුදා සිට සිකුරදා දක්වා
පෙ.ව 9.00 - ප.ව 5.00 දක්වා විවෘතයි.
1/44 King Street Dandenong VIC 3175
WARNALEGAL
Justice for all
03 9701 3718 info@warnalegal.com warnalegal1